# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විශ්වවිද්‍යාල ප්‍රවේශය 2022/2023

# යෝග්‍යතා පරීක්ෂණ

1. ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ඉංජිනේරුකරණ ගෞරව උපාධි පාඨමාලාව
2. ශාස්ත්‍රවේදී ගෞරව සිනමා හා රූපවාහිනී අධ්‍යයන උපාධි පාඨමාලාව
3. කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය (MIT)/ තොරතුරු තාක්ෂණය (IT) පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
4. කථන හා ශ්‍රවණ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
5. ශාස්ත්‍රවේදී ගෞරව භාෂා පරිවර්තන අධ්‍යයන උපාධි පාඨමාලාව
6. ක්‍රීඩා විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව

ඉහත උපාධි පාඨමාලාවන් සඳහා (2022/2023 අධ්‍යයන වර්ෂයට) විද්‍යාර්ථීන් තෝරා ගැනීම පිණිස කැලණිය විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණ සඳහා විද්‍යාර්ථීන්ගෙන් අයදුම්පත් 2023.09.25 දින දක්වා කැඳවනු ලැබේ.

සියලුම අපේක්ෂකයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිකුත් කළ, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය, අත්පොතේ දැක්වෙන තොරතුරුවලට අනුව අදාළ යෝග්‍යතා පරීක්ෂණවලට අයදුම් කිරීම අපේක්ෂා කෙරේ.

**ඉහත උපාධි පාඨමාලාවන්ට ඇතුළත්වීම සඳහා අයදුම්කරන අපේක්ෂකයින් මාර්ගගත ක්‍රමයට අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත අයදුම් කිරීමට අමතරව ඉහත සඳහන් යෝග්‍යතා පරීක්ෂණ සඳහා අයදුම් කළ යුතු අතර විභාගයට පෙනී සිටීම අනිවාර්යය වේ.**

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ට පමණක් මේ සඳහා අයදුම් කළ හැක.

(1) <u>ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ඉංජිනේරුකරණ ගෞරව උපාධි පාඨමාලාව</u>

(අ) 2022/2023 වර්ෂයේ අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී ආර්ථික විද්‍යාව, ගිණුම්කරණය සහ පහත දක්වා ඇති විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යය ලබා තිබිය යුතුය.

- ව්‍යාපාර අධ්‍යයනය
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- ව්‍යාපාර සංඛ්‍යානය
- කෘෂි විද්‍යාව
- භූගෝල විද්‍යාව
- සංයුක්ත ගණිතය
- ඉතිහාසය
- දේශපාලන විද්‍යාව
- භෞතික විද්‍යාව
- තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය

යෝග්‍යතා පරීක්ෂණයේ අරමුණ අපේක්ෂකයන්ගේ ගණිතමය, ඉංග්‍රීසි ප්‍රවීණතාව, සාමාන්‍ය දැනීම සහ විශ්ලේෂණ හැකියාවන් පිළිබඳව ප්‍රවීණතා ඇගයීමයි. **යෝග්‍යතා පරීක්ෂණය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.**

**(2)** ශාස්ත්‍රවේදී ගෞරව සිනමා හා රූපවාහිනී අධ්‍යයන උපාධි පාඨමාලාව

(අ) 2022/2023 වර්ෂයේ අ.පො.ස.(උ/පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් තුනකින් අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යය ලබා තිබිය යුතුය.

(ආ) යෝග්‍යතා පරීක්ෂණය ප්‍රධාන කොටස් දෙකක් යටතේ පැවැත්වීමට අපේක්ෂිත ය.

**01. ලිඛිත පරීක්ෂණය**

ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයේ දී සිනමා හා රූපවාහිනී විෂයය, සාමාන්‍ය දැනුම හා නිර්මාණශීලීත්වය පිළිබඳ නිපුණතාව අපේක්ෂා කෙරේ. **සිංහල මාධ්‍යයෙන් පරීක්ෂණය පැවැත්වේ.**

**02. වාචික පරීක්ෂණය**

ලිඛිත පරීක්ෂණයේ දී ඉහළ ම ප්‍රවීණත්වයක් පළ කළ අපේක්ෂකයින්ගේ සිනමා හා රූපවාහිනී ක්ෂේත්‍රයට ඇති කැමැත්ත හා ප්‍රායෝගික ව ඔවුන් වෙතින් ප්‍රදර්ශනය කරන කුසලතා පිළිබඳ සොයාබැලීමට අපේක්ෂිත ය. මෙම පරීක්ෂණය විශ්වවිද්‍යාලයට පැමිණ හෝ මාර්ගගත ක්‍රමය ඔස්සේ හෝ පවත්වනු ලබයි.

**(3)** කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය (MIT)/ තොරතුරු තාක්ෂණය (IT) පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව

(1) 2022/2023 වර්ෂයේ අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී උසස් ගණිතය, සංයුක්ත ගණිතය, ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන (C) සාමාර්ථයක් සහිතව

(අ) අ.පො.ස.(උ/පෙළ) විභාගයට ජෛවීය විද්‍යා විෂයය ධාරාවෙන් හෝ භෞතීය විද්‍යා විෂයය ධාරාවෙන් ඉදිරිපත්ව විෂයයන් තුනකින් සමත් වීම

හෝ

(ආ) ජෛවීය විද්‍යා විෂයය ධාරාවෙන් හෝ භෞතීය විද්‍යා විෂයය ධාරාවෙන් විෂයයන් දෙකක් සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂයය සමත් වීම

(2) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට යොමු කරන අයදුම්පතෙහි කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය (MIT)/ තොරතුරු තාක්ෂණය (IT) පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාවට ඉහළ ප්‍රමුඛතාවයක් ප්‍රකාශ කර තිබිය යුතුය. **පරීක්ෂණය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.**

**(4)** කථන හා ශ්‍රවණ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව

(1) 2022/2023 වර්ෂයේ අ.පො.ස.(උ/පෙළ) විභාගයේදී ජෛවීය විද්‍යා විෂයය ධාරාව, භෞතීය විද්‍යා විෂයය ධාරාව හෝ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි සඳහන් කොන්දේසිවලට යටත්ව තෝරා ගනු ලබන කලා විෂය ධාරාවේ ඕනෑම අනුමත විෂයයන් 03 ක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යය ලබා තිබිය යුතුය.

කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය මගින් පවත්වනු ලබන මෙම උපාධි පාඨමාලාවේ විශේෂ විෂය ක්ෂේත්‍ර වන්නේ කථන හා භාෂා චිකිත්සාව සහ ශ්‍රවණවේදයයි. ශ්‍රවණවේදය විශේෂ උපාධිය හැදෑරිය හැකි වන්නේ අ.පො.ස (උසස් පෙළ) විභාගයේ දී භෞතික විද්‍යාව විෂයයට පෙනී සිටි සිසුන්ට පමණි.

(2) මෙම යෝග්‍යතා පරීක්ෂණය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන් තුනෙන්ම පවත්වනු ලැබේ.

(5) <u>ශාස්ත්‍රවේදී ගෞරව භාෂා පරිවර්තන අධ්‍යයන උපාධි පාඨමාලාව</u>

(1) 2022/2023 වර්ෂයේ අ.පො.ස.(උ/පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් තුනකින් අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යය ලබා තිබිය යුතුය.

(2) මෙම පරීක්ෂණයේ අරමුණ අපේක්ෂකයන්ගේ සිංහල හා ඉංග්‍රීසි භාෂා පිළිබඳ ප්‍රවීණතාව ඇගයීමය. එබැවින් **මෙම යෝග්‍යතා පරීක්ෂණය සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.**

(6) <u>ක්‍රීඩා විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව</u>

(1) 2022/2023 වර්ෂයේ අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී ඕනෑම විෂය ධාරාවක් යටතේ, ඕනෑම විෂයයන් තුනකින් අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යය ලබා තිබිය යුතුය.

(2) යෝග්‍යතා පරීක්ෂණය ප්‍රධාන කොටස් දෙකක් යටතේ පැවැත්විමට අපේක්ෂිත ය.

(අ) <u>ලිඛිත පරීක්ෂණය</u>


ලිඛිත පරීක්ෂණයේ අරමුණ අපේක්ෂකයන්ගේ මූලික ගණිතය සහ විද්‍යාවේ ප්‍රවීණත්වය, ක්‍රීඩාව පිළිබඳ සාමාන්‍ය දැනීම සහ විශ්ලේෂණ හැකියාවන් පිළිබඳව ප්‍රවීණතාව ඇගයීමයි. **යෝග්‍යතා පරීක්ෂණය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.**

(ආ) <u>ප්‍රායෝගික සහ සම්මුඛ පරීක්ෂණය</u>

මෙම පරීක්ෂණයේ අරමුණ අපේක්ෂකයින් ගේ ප්‍රායෝගික යෝග්‍යතාව, ක්‍රීඩා කුසලතා සහ දක්ෂතා ඇගයීමයි. ප්‍රායෝගික පරීක්ෂණයේ දී අපේක්ෂකයින්ගේ ප්‍රායෝගික යෝග්‍යතාව ඇගයීමට සහ සම්මුඛ පරීක්ෂණයේ දී අපේක්ෂකයින් පළාත්, ජාතික සහ ජාත්‍යන්තරව ලබා ඇති ක්‍රීඩා දක්ෂතා තහවුරු කර ගැනීම ට සහ ඇගයීම ට අපේක්ෂිතය.

<u>අයදුම්කරන ආකාරය</u>

1. අයදුම් කිරීමට අපේක්ෂා කරන අපේක්ෂකයින් මහජන බැංකුවේ කැලණිය ශාඛාවේ අංක 055-1001-40009867 දරණ ගිණුමට රු. 1,600/- ක් බැරවන පරිදි ලංකාවේ ඕනෑම මහජන බැංකු ශාඛාවකට මුදල් ගෙවා ලබාගත් රිසිට්පතක මෘදු පිටපතක් (Soft copy/Scan Image) අතැතිව මාර්ගගත ක්‍රමය (online) ඔස්සේ පමණක් මෙහි දක්වා ඇති යොමුව (https://aptitude.kln.ac.lk) මගින් අයදුම් කළ යුතුය. **අයදුම් කිරීමේදී සක්‍රීය විද්‍යුත් තැපැලක් (e-mail) භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ.** බැංකු රිසිට්පත පිරවිය යුතු ආකාරය පිළිබඳ ආදර්ශයක් පහත දක්වා ඇත.


PEOPLE'S BANK
මහජන බැංකුව | மக்கள் வங்கி
තැන්පතු පත | வைப்புச்சீட்டு | Deposit Slip
Office Copy
Account Number: 0551001400009867
Date: 06 09 2023
Name of Account Holder: කැලණිය විශ්ව විද්‍යාලය
Give the following information only when a deposit of over Rs. 200,000/- is made by a person other than the Account Holder.
Name: තරුණ කුමාලි වික්‍රමසිංහ
Address: 525, පාසල් මාවත, රත්නපුර
Tel. No.
NIC/ P.P./ D.L. No. 200360803736
Purpose: විභාග හා ලියාපදිංචි
Cash Depositor's Signature
Notes | Rs. | Cts.
x 5000 | 1600 | 00
x 2000
x 1000
x 500
x 200
x 100
x 50
x 20
x 10
Coins
Total | 1600 | 00
Valid if Overprinted or Signed by an Officer
Do Not Write Anything Below This Line
Checked by

2. එසේම CDM යන්ත්‍ර භාවිතා කර මුදල් ගෙවන අපේක්ෂකයින් යන්ත්‍රයෙන් ලැබෙන රිසිට්පතේ **තමාගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම්කරන පරීක්ෂණයේ නම අනිවාර්යයෙන්ම සඳහන් කර අයදුම් කළ යුතුය.**

3. ඉහත (1) හා (2) ආකාරයන්ට අමතරව මාර්ගගත ක්‍රමය අනුව ද (online payment) ණය කාඩ්පත් (Credit Card) හෝ හර කාඩ්පත් (Debit Card) භාවිතා කරමින් ඉහත ගිණුම් අංකයට අදාළ ගෙවීම් සිදු කළ හැකිය.

බැංකු රිසිට්පත (බැංකු ශාඛාවෙන් හෝ CDM යන්ත්‍රයෙන් ලබා ගත්) විභාගය පැවැත්වෙන දින අනිවාර්යයෙන්ම රැගෙන පැමිණිය යුතු අතර එය විභාග මධ්‍යස්ථානය ඉදිරිපිට ඇති කවුන්ටරය වෙත භාර දිය යුතුය. **එසේ නොමැති නම් විභාගයට පෙනී සිටීමට හැකි වුවත් ප්‍රතිඵල නිකුත් කරනු නොලැබේ.**

ඉහත ලේඛනවල හා ඉල්ලුම් පත්‍රයේ තම නම සඳහන් වන ආකාරයේ වෙනසක් ඇතොත්, එකී වෙනස් නම් වලින් හැඳින්වෙන තැනැත්තා/තැනැත්තිය එක් අයෙකු බව තහවුරු කෙරෙන දිවුරුම් ප්‍රකාශයක් ද අදාළ කවුන්ටරය වෙත ඉහත ලියකියවිලි සමඟ භාර දිය යුතුය.

විභාග ප්‍රවේශපත්‍රය (admission card) බාගත කිරීම සඳහා (download) අදාළ සබැඳිය (link) ඔබගේ විද්‍යුත් තැපැල (e-mail) වෙත හෝ ජංගම දුරකතනයට කෙටි පණිවිඩයක් (SMS) මගින් ලැබෙන අතර ඒ මගින් ලබා ගත් මුද්‍රිත පිටපතක් ඔබ විසින් විභාගයට පැමිණෙන විට රැගෙන ආ යුතුය.

මෙම යෝග්‍යතා පරීක්ෂණය සඳහා ඔබගේ විභාග ප්‍රවේශ පත්‍රයෙහි සඳහන් විභාග පැවැත්වෙන දින විභාගය ආරම්භ වීමට පැයකට කලින් ඔබගේ අදාළ විභාග මධ්‍යස්ථානය වෙත වාර්තා කර තිබිය යුතුය.

අයදුම් කළ හැකි අවසන් දිනය **2023 සැප්තැම්බර් මස 25 දින වේ.** වැඩි විස්තර සඳහා දුරකථන අංක 011-2903112/114.

ලේඛකාධිකාරී
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය.

2023 සැප්තැම්බර් 06